# 74. දීඝනඛ සූත්‍රය.

1. **මා** විසින් (මේ සූත්‍රය) මෙසේ අසන ලදී. එක් කලෙක්හි භාග්‍යවතුන් වහන්සේ රජගහනුවර ගිජ්ඣකූට පර්වතයෙහිවූ සූකර ඛත නම් ලෙනෙහි වාසය කළහ. එකල්හි දීඝනඛ[1] නම් පරිව්‍රාජිකතෙම භාග්‍යවතුන් වහන්සේ යම් තැනෙක්හිද, එතැනට පැමිණියේය. පැමිණ, භාග්‍යවතුන් වහන්සේ සමග සතුටු විය යුතුවූ, සිහිකටයුතුවූ කථාව කොට නිමවා එක් පැත්තක සිටියාවූ දීඝනඛ නම් පරිව්‍රාජක තෙම භාග්‍යවතුන් වහන්සේට මෙය කීවේය.

2. “භවත් ගෞතමයන් වහන්ස, මම වනාහි 'සියල්ල මට රුචි නොවේය' යන මෙබඳු වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තේ වෙමි” යි කීය. “අග්ගිවෙස්සනය, 'සියල්ල මට රුචි නොවේය' යි තොපගේ යම් මේ දෘෂ්ටියක් වේ නම් මේ දෘෂ්ටියද තොපට රුචි නොවේදැ?” යි ඇසූහ.

“භවත් ගෞතමයන් වහන්ස, ඉදින් මේ දෘෂ්ටිය මට රුචි නොවන්නේ නම් ඒ 'සියල්ල මට රුචි නොවේ' යන දෘෂ්ටියද එබඳුම වන්නේය.”

“අග්ගිවෙසස්නය, යම් කෙනෙක් 'එය එබඳුම වන්නේය' 'එයද එබඳුම වන්නේය' යි කියමින් ඒ දෘෂ්ටිය අත් නොහැරම අනික් දෘෂ්ටියක් ගන්නාහුද ඔවුහුම ලෝකයෙහි ඉතා බොහෝ වෙත්.

“අග්ගිවෙස්සනය, යම් කෙනෙක්, 'එයද එබඳුම වන්නේය, එයද එබඳුම වන්නේය' යි කියමින් ඒ දෘෂ්ටියද දුරුකරමින් අනික් දෘෂ්ටියක්ද නොගන්නාහුද ඔවුහු ඉතා ස්වල්ප වෙත්.

3. “අග්ගිවෙස්සනය, 'සියල්ල මට රුචි වේය' යි යන මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණෝද ඇත්තාහ. අග්ගිවෙස්සනය, 'සියල්ල මට රුචිනොවෙයි' යන මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති ඇතැම් මහණ බමුණෝද ඇත්තාහ. අග්ගිවෙස්සනය, 'සමහරක් මට රුචි වේ. සමහරක් මට රුචි නොවේ' යි යන මෙබඳු වාද ඇති මෙබඳු දෘෂ්ටි ඇති මහණ බමුණෝද ඇත්තාහ.

4. “අග්ගිවෙස්සනය, ඔවුන් අතරෙන් යම් ඒ මහණ බමුණෝ 'සියල්ල මට රුචි වේය' යි වාද ඇත්තේ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත්ද, ඔවුන්ගේ මේ දෘෂ්ටිය රාග වශයෙන් සසරට සමීප වෙයි සසරට ඇලීම පිණිස වෙයි. සංයෝජන වශයෙන් සසරට සමීපවෙයි. සසරට ඇලීම වෙයි. තෘෂ්ණා දෘෂ්ටි දෙකින් සතුටුවීම් වශයෙන් සසරට ඇලීම වෙයි. තෘෂ්ණා දෘෂ්ටි දෙක්හි ගිලීමෙන් සසරට ඇලීම වෙයි.

---

[1] දීඝනඛ : නිය නොකපන ලදුව දික් නිය ඇත්තෙන් ජනයා දීඝනඛයැයි නම්කල මොහු සැරියුත් මහරහතුන් ගේ බෑණනුවෙකැයි සඟිය දක්වයි

[2] අග්ගිවෙස්සන යන පෙලපත් නාමයෙන් අමතා

ඔවුන් අතුරෙන් යම් ඒ මහණ බමුණෝ 'සියල්ල මට රුචි නොවේය' යන මෙබඳු වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත්ද, ඔවුන්ගේ ඒ දෘෂ්ටිය සසර නොඇල්මට සමීපවේ. සසර නොබැඳීමට හේතුවේ. තෘෂ්ණා දෘෂ්ටි දෙකින් සතුටු නොවීමට හේතු වෙයි. තෘෂ්ණා දෘෂ්ටි දෙක්හි නොගිලීමට හේතු වෙයි."

**6.** මෙසේ වදාළ කල්හි දීඝනඛ නම් පරිව්‍රාජික තෙම, "භවත් ගෞතම තෙමේ මාගේ දෘෂ්ටිය පසසන්නේය. භවත් ගෞතම තෙමේ මාගේ දෘෂ්ටිය අනුමත කරන්නේය," යි භාග්‍යවතුන් වහන්සේට කීය.

"අග්ගිවෙස්සනය, ඔවුන් අතුරෙන් යම් ඒ මහණ බමුණෝ 'සමහරක් මට රුචි වෙයි. සමහරක් මට රුචි නොවේය' යන මෙබඳු වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත්ද, යම් දෘෂ්ටියක් ඔවුන්ට රුචි වේද, ඒ දෘෂ්ටිය රාග වශයෙන් සසරට ළංවේ. සංයෝජන වශයෙන් සසරට ළංවේ. තණ්හා දිට්ඨි (ලෝභය හා වැරදි දැකීම) වශයෙන් සසරට ළංවේ. තණ්හා දිට්ඨි දෙක්හි ගිලීමෙන් සසරට ළංවේ. යම් දෘෂ්ටියක් ඔවුන්ට රුචි නොවේද ඒ දෘෂ්ටිය සසර නොඇලීමට ළංවේ. නොබැඳීමට ළංවේ. තෘෂ්ණා දෘෂ්ටි වශයෙන් සතුටු නොවීමට ළංවෙයි. තෘෂ්ණා දෘෂ්ටි දෙක්හි නොහිලීමට ළංවෙයි.

**6.** "අග්ගිවෙස්සනය, ඔවුන් අතුරෙන් යම් ඒ මහණ බමුණෝ 'සියල්ල මට රුචි වේය' යි මෙබඳු වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත්ද, එහි නුවණ ඇති පුරුෂ තෙම මෙසේ කල්පනා කරයි. 'සියල්ල මට රුචි වේය' යන මේ මාගේ දෘෂ්ටියක් වේද, ඉදින් මම මේ දෘෂ්ටිය දැඩි වශයෙන් අල්වාගෙන ඇතුළත්ව මෙයම සත්‍යය, අනික සිස්සයි ව්‍යවහාර කෙරෙම්ද, අදහන්නේද, ඒ නිසා මම අනෙක් වාද දෙක දරන්නවුන් සමග ගැටෙන්නේය.
එනම් යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'සියල්ල මට රුචි නොවේය' යි, මෙබඳු වාද ඇත්තේද, ඔවුන් සමග මට අප්‍රසාදය උපදින්නේය. යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'සමහරක් මට රුචි වේ, සමහරක් මට රුචි නොවේය' යි මෙබඳු වාද ඇත්තේ දෘෂ්ටි ඇත්තේත් වේද, ඔවුන් සමග මට අප්‍රසාදය උපදින්නේය.

මෙසේ අප්‍රසාදය ඇති කල්හි වාද විවාද වලට එළඹෙන්නේය, වාද විවාද වලට එළඹුන කල්හි සිත් තැවුල් වන්නේය. සිත් තැවුල් ඇති කල්හි වෙහෙස වන්නේය. මෙසේ හෙතෙම අප්‍රසාදයද විවාදයද සිත් තැවුල් ද වෙහෙසද තමාට ඇතිවන බව දැන ඒ දෘෂ්ටියද දුරු කරයි. අනික් දෘෂ්ටියක්ද නොගනියි. මෙසේ මේ දෘෂ්ටීන්ගේ ප්‍රහානය වේ. මෙසේ මේ දෘෂ්ටීන් ගේ දුරලීම වේ.

**7.** "අග්ගිවෙස්සනය, ඔවුන් අතුරෙන් යම් ඒ මහණ බමුණෝ 'සියල්ල මට සියල්ල රුචි නොවේයයි , මෙසේ වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටි ඇත්තෝ වෙත්ද, ඔවුන් අතුරෙන් නුවණ ඇති පුරුෂයෙක් තෙම මෙසේ සලකයි. 'සියල්ල මට රුචි නොවේය' යි මාගේ යම් මේ දෘෂ්ටියක් වේද, ඉදින් මම 'මේ දෘෂ්ටිය මෙයම සත්‍යය, අනික සිස්ය' යි දැඩි වශයෙන් අල්වාගෙණ ඇතුළත්ව වාසය කෙරෙම්ද, අනික සිස්සයි ව්‍යවහාර කෙරෙම්ද, අදහන්නේද, ඒ නිසා මම අනෙක් වාද දෙක දරන්නවුන් සමග ගැටෙන්නේය.

එනම් යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'සියල්ල මට රුචි වේය' යි, මෙබඳු වාද ඇත්තේද, ඔවුන් සමග මට අප්‍රසාදය උපදින්නේය. යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'සමහරක් මට රුචි වේ, සමහරක් මට රුචි නොවේය' යි මෙබඳු වාද ඇත්තේ දෘෂ්ටි ඇත්තේත් වේද, ඔවුන් සමග මට අප්‍රසාදය උපදින්නේය.

මෙසේ අප්‍රසාදය ඇති කල්හි වාද විවාද වලට එළඹෙන්නේය, වාද විවාද වලට එළඹුන කල්හි සිත් තැවුල් වන්නේය. සිත් තැවුල් ඇති කල්හි වෙහෙස වන්නේය. මෙසේ හෙතෙම අප්‍රසාදයද විවාදයද සිත් තැවුල් ද වෙහෙසද තමාට ඇතිවන බව දැන ඒ දෘෂ්ටියද දුරු කරයි. අනික් දෘෂ්ටියක්ද නොගනියි. මෙසේ මේ දෘෂ්ටීන්ගේ ප්‍රහානය වේ. මෙසේ මේ දෘෂ්ටීන් ගේ දුරලීම වේ.

8. “අග්ගිවෙස්සනය, ඔවුන් අතුරෙන් යම් ඒ මහණ බමුණෙක්, 'සමහරක් මට රුචිවේ. සමහරක් මට රුචි නොවේයයි , මෙබඳු වාද ඇත්තෝ මෙබඳු දෘෂ්ටිය ඇත්තෝ වේද, එහි නුවණ ඇති පුරුෂයෙක් තෙම මෙසේ සලකයි. 'සමහරක් මට රුචි වේ, සමහරක් මට රුචි නොවේය' යි, මාගේ යම් මේ දෘෂ්ටියක් වේද, ඉදින් මම මේ දෘෂ්ටිය දැඩි වශයෙන් අල්වාගෙණ ඇතුළත්ව වාසය කෙරෙම්ද, අනික සිස්සයි ව්‍යවහාර කෙරෙම්ද, අදහන්නේද, ඒ නිසා මම අනෙක් වාද දෙක දරන්නවුන් සමග ගැටෙන්නේය.

එනම් යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'සියල්ල මට රුචි වේය' යි, මෙබඳු වාද ඇත්තේද, ඔවුන් සමග මට අප්‍රසාදය උපදින්නේය. යම් මේ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ 'සමහරක් මට රුචි නොවේය' යි මෙබඳු වාද ඇත්තේ දෘෂ්ටි ඇත්තේත් වේද, ඔවුන් සමග මට අප්‍රසාදය උපදින්නේය.

මෙසේ අප්‍රසාදය ඇති කල්හි වාද විවාද වලට එළඹෙන්නේය, වාද විවාද වලට එළඹුන කල්හි සිත් තැවුල් වන්නේය. සිත් තැවුල් ඇති කල්හි වෙහෙස වන්නේය. මෙසේ හෙතෙම අප්‍රසාදයද විවාදයද සිත් තැවුල් ද වෙහෙසද තමාට ඇතිවන බව දැන ඒ දෘෂ්ටියද දුරු කරයි. අනික් දෘෂ්ටියක්ද නොගනියි. මෙසේ මේ දෘෂ්ටීන්ගේ ප්‍රහානය වේ. මෙසේ මේ දෘෂ්ටීන් ගේ දුරලීම වේ.

9. “අග්ගිවෙස්සනය, සතර මහා භූතයන්ගෙන් සමන්කෘතවූත්, මවුපිය සම්භවයෙන් හටගත්, බතින් හා කැඳෙන්[3] පෝෂ්‍යව වැඩුණු මේ කය, ඇතිල්ලීම, ගැටීම හේතුකරගෙන, බිඳීමය, විනාසය, ස්වභාව කොට ඇත්තක. අනිත්‍යය ස්වභාව කොට ඇත්තක. මේ කයේ නත්‍යය ස්වභාවය, අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන, රෝග වශයෙන්, ගඩක්[4] වශයෙන්, හුලක් වශයෙන්, ලාමකවූවක් වශයෙන්, ආබාධයක් වශයෙන්, අන්‍යවූවක් වශයෙන්, තමනගේ පාලනයේ නොපවත්වන්නක් ලෙස, දැක්ක යුතුය. විනාශවීමම ස්වභාවකොට ඇත්තාවූවක් ලෙස දැක්ක යුතුය. අනාත්ම වශයෙන් දැක්ක යුතුය.

මේ කය අනිත්‍ය වශයෙන්, දුක් වශයෙන්, රෝග වශයෙන්, ගඩක් වශයෙන්, හුලක් වශයෙන්, විපතක් වශයෙන්, ලාමකවූවක් වශයෙන්, ආබාධයක් වශයෙන්, අන්‍යවූවක් වශයෙන්, තමනගේ පාලනයේ නොපවත්වන්නක් වශයෙන්, නැසෙන්නක් වශයෙන්, ශූන්‍යවූවක් වශයෙන්, අනාත්ම

[3] Prrridge, or any edible made out of flour
[4] Malignanr Tumor

වශයෙන් දක්නාවූ ඔහු, මේ කය පිලිබඳවවූ යම් ඇල්මෙක්, යම් ස්නේහයෙක්, කය අනුව යාමක් වේද, එය දුරුකරයි.”

10. “අග්ගිවෙස්සනය, වේදනාවෝ තුන් ආකාර වෙත්. සැප වේදනාය, දුක් වේදනාය, දුක්ද නොවූ සැපද නොවූ (අදුක්කම සුක) වේදනාය යන වේදනා තුනයි.

අග්ගිවෙස්සනය, යම් කලෙක්හි කෙනෙක් සැපවූ වේදනාවක් විඳිද, එකල්හි ඔහු දුක්වූ වේදනාවක් නොවිඳියි. (දුක්ද නොවූ සැපද නොවූ) අදුක්කම සුක වේදනාවක් නොවිඳියි. අග්ගිවෙස්සනය, යම් කලෙක්හි කෙනෙක් දුක්වූ වේදනාවක් විඳිද, එකල්හි ඔහු සැපවූ වේදනාවක් නොවිඳියි. දුක්ද නොවූ සැපද නොවූ (අදුක්කම සුක) වේදනාවක් නොවිඳියි. එකල්හි දුක්වූ වේදනාවම විඳියි. අග්ගිවෙස්සනය, යම් කලෙක්හි කෙනෙක් දුක්ද නොවූ සැපද නොවූ (අදුක්කම සුක) වේදනාවක් විඳිද, එකල්හි ඔහු සැපවූ වේදනා නොවිඳියි. දුක්වූ වේදනා නොවිඳියි. එකල්හි දුක්ද නොවූ සැපද නොවූ (අදුක්කම සුක) වේදනාවම විඳියි.”

“අග්ගිවෙස්සනය, සැප වේදනාවද අනිත්‍යය, හේතු ප්‍රත්‍යයන්ගෙන් සකස් කරණ ලද්දේය , හේතු ප්‍රත්‍යයන්ගෙන් හට ගන්නිය, හේතු ප්‍රත්‍යයන් නිසා ක්‍ෂය වන ස්වභාව ඇත්තිය, විනාසය ස්වභාව කොට ඇත්තිය, විරාගය ස්වභාව කොට ඇත්තිය, නිරෝධය ස්වභාව කොට ඇත්තිය.”

“අග්ගිවෙස්සනය, දුක් වේදනාවද අනිත්‍යය, හේතු ප්‍රත්‍යයන්ගෙන් සකස් කරන ලද්දිය, හේතු ප්‍රත්‍යයන්ගෙන් හටගත්තිය, ක්‍ෂයවීම ස්වභාව කොට ඇත්තිය, විනාසය ස්වභාව කොට ඇත්තිය, විරාගය ස්වභාව කොට ඇත්තිය, නිරෝධය ස්වභාව කොට ඇත්තිය,”

“අග්ගිවෙස්සනය, දුක්ද නොවූ සැපද නොවූ වේදනාවද අනිත්‍යය, හේතු ප්‍රත්‍යයන්ගෙන් සකස් කරන ලද්දිය, හේතු ප්‍රත්‍යයෙන් හටගත්තිය, ක්‍ෂයවන ස්වභාව ඇත්තිය, විනාසවන ස්වභාව ඇත්තිය, විරාග ස්වභාව ඇත්තිය, නිරෝධය ස්වභාව කොට ඇත්තිය.”

11. “අග්ගිවෙස්සනය, මෙසේ දක්නාවූ ඇසූ පිරූ තැන් ඇති ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම සැප වේදනාව කෙරෙහිද කලකිරෙයි. දුක් වේදනාව කෙරෙහිද කලකිරෙයි. දුක්ද නොවූ සැපද නොවූ වේදනාව කෙරෙහිද කලකිරෙයි. එසේ කලකිරෙන්නේ නොඇලෙයි. එසේ නොඇලීමෙන් ආර්‍ය්‍ය ශ්‍රාවක තෙම සසරින් මිදෙයි. සසරින් මිදුනු කල්හි ‘සසරින් මිදුනේය’ යන දැනීම ඇතිවේ. ජාතිය ක්‍ෂය කරන ලද්දිය. නැවත උපතක් නොවන්නේය. බ්‍රහ්මචර්‍ය්‍යය වැස නිමවන ලද්දේය. කලයුත්ත කරන ලද්දේය. සසර මගින් කල යුත්ත කරන ලදි. මේ ආත්මභාවය පිණිස කළයුතු අනිකක් නැතැයි දැනගනියි.”

**“අග්ගිවෙස්සනය, මෙසේ මිදුනු සිත් ඇත්තාවූ භික්‍ෂු තෙමේ වනාහි කිසිවෙකුගේ මතයක් සමග විරුධව කථා නොවෙයි. කිසිවෙකු සමගත් විවාද නොකරයි. ලෝකයෙහි යම් ව්‍යවහාරයක් වේද, ඒ ව්‍යවහාරයෙන් ව්‍යවහාර කරයි. ලෝකයෙහි ඇති කිසිදු මතයක් දෘෂ්ටි වශයෙන් අල්ලා නොගනියි.”**

**12.** එකල්හි වනාහි ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙම භාග්‍යවතුන් වහන්සේගේ පිටුපසින් භාග්‍යවතුන් වහන්සේට පවන් සලමින් සිටියේ වෙයි. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ට මෙබඳු අදහස් විය. 'භාග්‍යවතුන් වහන්සේ වනාහි අපට නුවණින් දැන ඒ ඒ ධර්මයන්ගේ දුරුකිරීම වදාළේය. සුගතයන් වහන්සේ වනාහි අපට නුවණින් දැන ධර්මයන්ගේ දුරලීම වදාළේය' යි. මෙසේ මෙනෙහි කරන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන්ගේ සිත තෘෂ්ණා දෘෂ්ටීන්ගෙන් අලවා නොගෙන ආශ්‍රවයන්ගෙන් මිදුනේය.

දීඝනඛ පරිව්‍රාජකයාහට වනාහි යම් කිසිවක් ඉපදීම ස්වභාව කොට ඇත්තේද, ඒ සියල්ල නිරුද්ධවීම ස්වභාව කොට ඇත්තේයයි කෙලෙස් රජස් රහිතවූ පහවූ මල ඇති ධර්ම චක්ෂුස (සෝවාන් මාර්ග ඥානය) පහළවූයේය.

**13.** ඉක්බිති දීඝනඛ නම් පරිව්‍රාජක තෙමේ, දක්නා ලද ධර්මය ඇත්තේ, පැමිණියාවූ ධර්මය ඇත්තේ, දැනගන්නාලද ධර්මය ඇත්තේ, බැසගත්තාවූ ධර්මය ඇත්තේ, දුරු කළාවූ විචිකිච්ඡා ඇත්තේ, පහවූ සැකය ඇත්තේ, විසාරද බවට පැමිණියේ, ශාස්තෘ ශාසනයෙන් පිට අන් පිහිටක් නොසොයන බවට පැමිණියේ, භාග්‍යවතුන් වහන්සේට මෙසේ කීවේය.

"භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත, භවත් ගෞතමයන් වහන්ස, ඉතා යහපත, භවත් ගෞතමයන් වහන්ස, යම්සේ යටිකුරු කොට තබන ලද්දක් උඩුකුරු කරන්නේද, වසා තබන ලද්දක් හෝ වැසුම් අරින්නේද, මංමුළාවූවෙකුට හෝ මග කියන්නේද, අන්ධකාරයෙහි හෝ 'ඇස් ඇත්තෝ රූප දකිත්වා' යි තෙල් පහනක් දරන්නේද, මෙපරිද්දෙන් භවත් ගෞතමයන් වහන්සේ විසින් නොයෙක් ප්‍රකාරයෙන් ධර්මය දේශනා කරණ ලදි."

"මේ මම අද පටන් භවත් ගෞතමයන් වහන්සේ සරණ කොට යමි. ශ්‍රී සද්ධර්මයද භික්ෂු සංඝයාද සරණ කොට යමි. භවත් ගෞතමයන්වහන්සේ අද පටන් මා දිවිහිම් කොට සරණගියාවූ උපාසකයෙකැයි දරණ සේක්වා" යි කීය.

**දීඝනඛ සූත්‍රය නිමි. ( 3-4 )**

SLIGHTLY EDITED BY RANJITH DALUWATTA